දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister – 2784832

ලේකම් / செயலாளர் / Secretary – 2784811

කාර්යාලය / அலுவலகம் / Office – 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
இசுருபாய ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ……………………………

මගේ අංකය / எமது இல. / My No. ED/01/26/07/03/01

දිනය / திகதி / Date 2012-08-27

**චක්‍රලේඛ අංකය : 2012/24**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

**<u>සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පරිගණක මධ්‍යස්ථාන ප්‍රශස්ත මට්ටමින් භාවිතය</u>**

2005 වර්ෂයේ දී ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි පාසල්වලට සූර්ය බලයෙන් ක්‍රියාත්මකවන පරිගණක 10 බැගින් වු පරිගණක මධ්‍යස්ථාන 100 ක් ලබා දීම නව ආදර්ශ ප්‍රාථමික පාසල් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ Solar Photovoltaic Aided Computer Education (SPACE) නම වු ව්‍යාපෘතිය මගින් සිදුකර ඇත.
එම පරිගණක මධ්‍යස්ථාන වෙත ලබා දී ඇති පරිගණකවල වගකීම් කාල සීමාවන් අවසන් වී ඇත. එමෙන් ම සූර්ය කෝෂ සේවා සපයන ආයතන මෙම මධ්‍යස්ථානවලට ලබා දී ඇති මාදිලියේ උපාංග (Solar Inverter Model) ආනයනය කරනු නොලබන බව ද වර්තා වී ඇත.

එබැවින් අදාළ පරිගණක මධ්‍යස්ථාන ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

1) සූර්ය කෝෂ පද්ධති අක්‍රිය ව පවතින එහෙත් දැනට විදුලිය ආසන්නයට පැමිණ ඇති පාසල්වල පරිගණක මධ්‍යස්ථාන වෙත විදුලි සම්බන්ධතාව ලබා දීම.

    a) මෙම කාර්යයේ පළමු පියවර ලෙස දැනට සූර්ය කෝෂ පද්ධති ස්ථාපිත කර ඇති පාසල් 53 ක විදුහල්පති කාර්යාල වෙත විදුලිය ලබාගෙන ඇති බැවින් එම කාර්යාලයේ සිට පරිගණක මධ්‍යස්ථානය වෙත විදුලි දිගුවක් (Power Extension) ලබා ගැනීමට විදුහල්පතිවරුන්ට අවසර ලබාදීම.

b) දෙවන පියවර ලෙස එසේ විදුලි දිගුවක් ලබා ගැනීමට අවශ්‍ය විදුලි උපකරණ (D-board, Main Switch, Load Wire, etc.) මිල දී ගැනීමට හා මෙම මධ්‍යස්ථාන සඳහා අඛණ්ඩ ජව සැපයුම් ඒකක (UPS) ලබාදීමට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් සිදුකළ යුතුය.

2) විදුලියෙන් ක්‍රියාකරවිය හැකි පාසල් පරිගණක මධ්‍යස්ථානවල තිබෙන භාවිතයට ගත හැකි සූර්ය බල පද්ධති උපාංග, විදුලිය ලබාගත නොහැකි ප්‍රදේශවල පිහිටි මධ්‍යස්ථානවල සූර්ය බල පද්ධති උපාංග අලුත්වැඩියාව සඳහා යොදා ගැනීම හා එම උපාංග දෙවනුව සඳහන් කළ පාසල්වලට ප්‍රවාහනය කිරීම.

3) ඉහත සඳහන් අලුත්වැඩියා කටයුතු ඉටු කර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පරිගණක දෘඩාංග හා ඉලෙක්ට්‍රොණික පුහුණුව ලබා දී ඇති ගුරුභවතුන්ගේ සහාය ලබා ගැනීමට පියවර ගැනීම.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් : 1. පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යක්ෂ

2. කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යක්ෂ